සතුරු මිතුරු....4 වන පිටුවෙන්

අපේ දුර්වල ලංකා රජය කරන්නටය කී සියල්ල කළේය. දෙමළ නිල භාෂාවක් කිරීම, බලය බෙදාදීම, පළාත් සභා ඇති කිරීම, 13 වන සංශෝධනය ක්‍රියාත්මක කිරීම, උතුර හා නැගෙණහිර එකට ඈඳීම ආදී ඒ සියල්ල අකුරටම ඉටු කළේය. ඒ සමහර කාරණා සම්මත කරගත්තේ හදිසි නීතිය පවා පැනවීමෙනි. එහෙත් කොටි කබල් ආයුධ කෑලි කීපයක් දුන්නා විනා හොඳ ආයුධ කිසිවක් බාරදුන්නේ නැත. උන් ඒවා මතු ප්‍රයෝජනයට සඟවා තැබූහ.

අවාසනාව නම් අප ලවා බලයෙන් අත්සන් කරවාගත් එම ගිවිසුම අවලංගු කරගන්නට ඊට පසු බලයට ආ අපේ දේශපාලකයන් කිසිවෙකුවත් වසර 25 ක් යන තෙක් කිසිදු උත්සාහ නොකිරීමයි.

අවසානයේ අගමැති රජීව් ගාන්ධි මරාගෙන මැරෙන කොටි කතකගේ බෝම්බයකින් මිය ගියේය. ඉන්දිරාත් ඇගේ පුතුන් දෙදෙනාමත් මැරුණේ ඉතා බෙදජනක ලෙසය. ඉන්දියාවේ අශෝභන කපටි රාජ්‍ය තාන්ත්‍රිකකම් සහිත දේශපාලනය ඔවුන්ට ම විනාශය ගෙන ආවේ ය.

එහෙත් වඩාත්ම හාස්‍ය ජනක කාරණය නම් තමන්ම කිරි පෙවූ කොටින් මෙල්ලකරගන්නට නොහැකි වූ ඉන්දියන්කාරයෝ අප රජය හා අප ත්‍රිවිධ හමුදා විසින් කොටි හැත්ත මුළුමනින් විනාශ කර දමනු ලැබුවාට පසුවත් අපේ ප්‍රශ්න විසඳන හැටි දැන් අපට කියා දෙන්නට එති. ලංකාවේ බලය බෙදා දිය යුතු බවත්, 13 වන සංශෝධනයක් ගෙන ආයුතු බවත් කියති. ඔවුන් මේ නැවතත් සූදානම් වන්නේ ඒ කාලයේ රජීව් ගාන්ධිගේ මාර්ගයෙන් අපේ රටට ගෙන ආ ගිවිසුම් යළිත් අප ලවා ක්‍රියාත්මක කරවන්නට ය. මෙය ලංකාවේ ප්‍රශ්න විසඳන්නට ගන්නා උන්ගේ වෑයමක් නොවේ. මෙය වක්‍ර ආකාරයෙන් ලංකාව තුළ වෙසෙන ජන කොටස් අතර හැප්පීම් ඇති කරවා ලංකාව යළිත් අරාජික තත්වයක් කරා ගෙන එන්නට කරන ප්‍රයත්නයකි. එසේම ඔවුන්ගේ අණසකට අප යටත් කරවා ගෙන ඔවුන් කලාපයේ මහ බලවතා ය යන බව අපට පෙන්නා දෙන්නට ය. අප කෙළින්ම කිව යුත්තේ මෙයයි

"අනේ උදව් කරන්න දැයි ඇහුවට බොහොම ස්තුතියි... උදව් එපා... අපට පුළුවනි අපේ ජාතික ප්‍රශ්න අපටම විසඳගන්න... තැන්ක් යූ... තැන්ක් යූ...." කියා ය.

මේ අවස්ථාවේ ශ්‍රීලංකා ජනාධිපතිවරයා ස්ථිරවම ප්‍රකාශ කර සිටියේ, පාර්ලිමේන්තුව මගින් ජාතික ප්‍රශ්න විසඳන්නට සෑම ජන කොටස කගේම සහභාගිත්වයෙන් යුතු විශේෂ කමිටුවක් පත්කර ඇති බවත්, තමා ඇතුලු ලාංකික සැවොම එම කමිටුව මගින් යෝජනා කරන දෑ පිළිගත යුතු බවත් ය. එය හිතට දිරි දෙන ප්‍රකාශයකි. ඊටත් වඩා ප්‍රජාතන්ත්‍ර වාදයක් තවත් තිබේ ද ?

**Ilford - Essex -UK**

# දෑසෙහි වටිනාකම

**මෑ**තකදී මම මගේ ඇසේ සුද (cataract) ඉවත්කිරීමේ ශල්‍යකර්මයකට භාජනය වුනෙමි. මගේ ඇස් දෙකේ වටිනාකම මට වඩාත් තේරුම්ගියේ සැත්කමෙන් පසුව ඇස් දෙකේ පෙනුම වැඩිවුනාට පසුවය. දැන් මට පෙරටත් වඩා පක්ෂීන්ගේ සහ වෘක්ෂ ලතාවන්හි ස්වාභාවික ලක්ෂණ මැනවින් පෙනේ.


අපේ එදිනෙදා ජීවිතයේ අපට ඇස් දෙක මහත් සේ ප්‍රයෝජනවත් වන බව අතිශයෝක්තියක් නොවේ. එදිනෙදා ජීවිතයේදී මහ මග පරෙස්සමෙන් ගමන් කිරීමට, රිය ධාවනය කිරීමට, පොත පත ලිවීමට කියැවීමට, ටෙලිවිෂන් බැලීමට, පරිගණක වැඩට ආදී අනේක කාර්යයන්ට දෑස නොමැතිව බැරිය.

නමුත් අභාග්‍යකට මෙන් අප බොහෝ දෙනා වයසට යාමත් සමග දෘෂ්ටි ආබාධයන්ට ලක්වන්නේ ය. ඇස් කණ්ණාඩි සහ මෑත යුගයේ සිට භාවිතාවන සිවි කාචයන් (contact lenses) අපට මහත්සේ ප්‍රයෝජනවත්ය. ඇස් කණ්ණාඩි බිඳෙන සුළුය. එපමණක්ද නොව සමහර විට අපේ කණ්ණාඩි දෙක හෙවත් උපැස් යුවල තිබූ තැනකින් සොයා ගන්නට ද අපහසු අවස්ථාවන් ද ඇත. සිවිකාච ඉතා සියුම්ය. ඒවා පැළඳ සිටින බවද මුහුණ දිහා බලන කෙනෙකුට නොපෙනේ. එහෙත් ඒවා ද ඉතා සැලකිල්ලෙන් බලාගත යුත ු ය. සිවිකාච හා ඇස් කණ්ණාඩි පාවිච්චිය දැන් කල් ඉක්මවූ දේවල් ය. දැනට ඇති පෙනුම ලබාදෙන නවීනතම ක්‍රමය නම් ලේසර් කිරණ (laser) මගින් ශල්‍යකර්මයක් කර අඩාල වූ පෙනුම නිවැරදි කිරීම ය.

ඉහත සඳහන් පිළියම් සියල්ලම පාර්ශව වශයෙන් ඇස් නොපෙනෙන අයට ප්‍රයෝජනවත්ය. එහෙත් උපතින්ම ඇස් අන්ධවූවෙක් හෝ අනතුරකට භාජනය වීම නිසා අන්ධවූවෙකු පොතපත කියවන්නේ කෙසේද, ලියන්නේ කෙසේද යන්න ඔබ කල්පනාකර තිබේ ද?

1821 දී ලුවී බ්‍රේල් (Louis Braille) නම් ප්‍රංශ ජාතිකයා මෙයට පිළියමක් සොයාගත්තේය. ඔහුගේ ජීවිත කතාව දුක්මුසු එකක් වුවද අනෙක් අතින් පුදුම එළවන සුළු එකකි. ලුවීගේ පියා අශවයින්ගේ පිට යාම සඳහා සෑදල ( Saddle) සාදන්නෙක් වීය. දිනක් පියා අත තිබූ විදින කටුවක් වැදී ලුවීගේ ඇසකට අනපේක්ෂිත තුවාලයක් සිදුවිය. එම නිසා ඔහුගේ දකුණු ඇස සම්පූර්ණයෙන් ම අන්ධ වූයේය. එයින් හටගත් විෂබීජ යාමෙන් ඔහුගේ අනෙක් ඇසත් අන්ධ වූයේය. එවිට ඔහුගේ වයස අවුරුදු 3 ක් වීය.

දස අවුරුදු වියේ දී ලුවීට පැරිසියේ ජාතික අන්ධ විද්‍යාලයට (National Institute for the Blind) යාමට ශිෂ්‍යත්වයක් ලැබුණි එය ලෝකයේ ප්‍රථම අන්ධ අධ්‍යාපන පීඨය ලෙස සැලකේ. එහිදී ලාබාල ලුවීට ඉමහත්




The Inventor of the Braille System

***බ්‍රේල් ක්‍රමයේ නිර්මාතෘ ලුවී බ්‍රේල්***

කරදර රාශියකට මුහුණදෙන්නට සිදුවීය. ඔහුට බොහෝ විට ආහාර වශයෙන් ලැබුණේ පිළුණු පාන් සහ ඇල්වතුර පමණ ය. එපමණක් ද නොව එම ආයතනයේ සිටි කෲර පාලකයෝ බොහෝ අවස්ථාවල දඬුවම් වශයෙන් සිසුන් සිරකර තැබුවෝ ය.


මෙවන් මහත් කරදර මධ්‍යයේ වුව ද කුඩා ලුවී ස්වෝත්සාහයෙන් වයලීන් වාදනය ඉගෙන ගත්තේ ය. ඉන්පසු ඔහු දක්ෂ වයලීන් වාදකයෙකු වීය. ප්‍රංශයේ නොයෙක් ප්‍රදේශවල දේව මන්දිරවල වයලීනය වාදනය කිරීමට ඔහුට ආරාධනා ලැබුණේය .

1821 දී ප්‍රංශ යුදහමුදාවේ හිටපු කපිතාන්-වරයෙකු වන චාර්ල්ස් බාර්බියර් සටන් බිමේ සොල්දාදුවන් අතර වචනයකුදු කතා නොකර පණිවුඩ හුවමාරු කරගන්නා ක්‍රමයක් නිර්මාණය කළේ ය. එනම් ඝණකම ඇති කොළයක විදින ලද කුඩා හිල් සංඛ්‍යාවක් සහ හරස් ඉරි කීපයක් අතගා බැලීමෙන් රහසිගත පණිවුඩය කුමක්දැයි හටයින්ට දැනෙන්ට සැලැස්වීමයි. අඳ පාසැල නැරඹීමට පැමිණි බාර්බියර් ඒ අන්ධ සිසුන්ට ඉහතකී හිල් සටහන භාවිතාකරන හැටි කියා දුන්නේ ය.

පියාගේ සෑදල් සාදන මෙවලම් මල්ලේ ඇති විදින කටුව අතගා හුරු පුරුදු ලුවී මෙම සටහන ආශ්‍රයෙන් ඊටත් වඩා හොඳ, වඩා දියුණු, එසේම ඇඟිලිවලින් හිල් ස්පර්ශ කළ විගස වචන කියවන්නට පමණක් නොව, හිල් විද අකුරු ලියන්නට ද හැකි ක්‍රමයක් නිර්මාණය කළේය. බ්‍රේල් ක්‍රමයේ උපත එයයි.

බ්‍රේල් ක්‍රමය ඉතාම කෙටියෙන් මෙසේ සඳහන් කළ හැකිය. සමතලා කඩදාසියක හෝ කාඩ්බෝඩ් කෑල්ලක තැනින් තැන විදින ලද හිල් නිසා උස්වූ බිබිලි ඇත. එම බිබිලි ඉංග්‍රීසි හෝඩියේ අක්ෂර මාලාවට සරිලන පරිදි යොදා තිබේ. ඒවා අතගෑමෙන් අන්ධයන්ට උස් තැන් පහත් තැන් දැනේ. එයින් ඔව්හු අකුරු





Braille is a tactile system of raised dots representing letters of the alphabet. To read braille, the fingers gently glide over paper that has been embossed with the braille code. For note taking, a pointed instrument is used to punch out the dots on paper held in a metal slate. The readable raised dots appear on the other side of the paper.

හඳුනාගෙන වචනයක තේරුම මනාව දැනගනිති.

බ්‍රේල් ක්‍රමය මුළු ලොව පුරාම භාවිතාවන්නට වූ අතර එය සෑම රටකම අන්ධ අයට ඉමහත් සහනයක් ගෙන දුන්නේය. කියවීමට හා ලිවීමට ඔවුන්ට මහෝපකාරී විය. ඇත්ත වශයෙන් ප්‍රථම වතාවට අංකන (digital) ක්‍රමය සොයාගත්තේ ලුවී බ්‍රේල් ය. දැන් නම් ලෝකයේ අංකන ක්‍රමය ගැන නොදන්නා කෙනෙක් නැති තරම් ය. පරිගණක යන්ත්‍රය ක්‍රියාකරවීම සහ සහ පණිවුඩ යැවීම කෙරෙනුයේ අංකන ක්‍රමයට ය. මෙහිදී මම බ්‍රේල්ගේ ක්‍රමය වැඩිදුර විග්‍රහ නොකරමි. එයට මෙම පත්‍රයේ විශාල කොටසක් අවශ්‍ය වේ. මෙය දළ වශයෙන් දැනගැනීමට නම් ලන්ඩන් නගර යේ පාර හරහා මාරුවන තැනක පදික වේදිකාවේ බ්‍රේල් ක්‍රමයට සමීප ක්‍රමයක් සකස්කර ඇත. අන්ධයින්ගේ සැරයටියට එය දැනේ. එම නිසා ඔවුනට ප්‍රවේශ මෙන් පාර හරහා කෙනෙකුගේ උපකාරයක් නැතිවම යා හැකිය.

අපි පළමුවෙන් පාර්ශව අන්ධයින් ගැන කතකළෙමු. ඉන් පසු බ්‍රේල් ක්‍රමය ගැන සඳහන් කළෙමු. අන්ධයින් සඳහා ඇති නවීන තාක්ෂණ ක්‍රමයක් ගැන ද මෙහි සඳහන් කිරීම වටී.

මෑතකදී ප්‍රංශ ජාතික මික්කා ටෙර්හෝ (Mikka Terho) නමැති අන්ධ පුද්ගලයාට කෘතිම ශරීරාංග ක්‍රමයට (Bionic) පෙනුම ලබාදීමට විද්‍යාඥයින්ට හැකිවිය. ඔහු අවුරුදු දහයකට පෙර ජානමය හේතූන් නිසා සම්පූර්ණයෙන්ම අන්ධ වූයේය. වෛද්‍යවරු ඔහුගේ ඇස්වලට පරිගණකයන්ට යොදන චිප් (chip) පෙත්තක් සවි කළෝය. එයින් ඔහුගේ ඇස්වලට ආලෝක කිරණ ඇතුල් විය. දින තුනකට පසුව ඔහුගේ කෑම මේසය මත තිබුණු ආහාර බඳුන් හඳුනාගැන්මට ඔහුට හැකිවුණි. නවීන විද්‍යාවේ හාස්කම නිසා 46 හැවිරිදි මික්කාට කියවීමේ හැකියාව දැන් ලැබීගෙන එන්නේ ය.

විද්‍යාවේ පරිකල්පිත දේ නියම විද්‍යාවට හැරෙන මේ අවධියේ අන්ධභාවය නමැති දුබලතාව මෙලොවින් තුරන්වී අප සැමට පැහැදිලිසේ ලොව දිහා බැලීමට හැකිවේවායි යනු මගේ පැතුමයි.

◆ ***මහාචාර්ය සම්පත් ඇන්සන් ප්‍රනාන්දු***
***Prof. Sampath Anson Fernando***
**Essex UK**

